[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் ...

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 09 ශ්‍රේණිය | විද්‍යාව | පත්‍රය I/II | පැය - 2 යි. |
|---|---|---|---|

නම ..........................................................................................................................................

**සැළකිය යුතුයි.**

- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**
- **1 සිට 20 දක්වා ප්‍රශ්නය සඳහා නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01). බහු සෛලික ජීවියෙකු වන්නේ,
1). ඇමීබා 2). යීස්ට් 3). හයිඩ්‍රා 4). පැරමීසියම්

02). රෝග කාරක දිලීර ආසාදනය වීම නිසා හටගන්නා රෝගයකි,
1). ක්ෂය රෝගය 2). සරම්ප 3). සිපිලිස් 4). අළුහම්

03). මූල ද්‍රව්‍ය වල තැනුම් ඒකකය පරමාණුව බව මුලින්ම ප්‍රකාශ කරන ලද්දේ,
1). ජේ.ජේ. තොම්සන් 2). අර්නස්ට් රදර්ෆඩ්
3). ජෝන් ඩෝල්ටන් 4). දිමිත්‍රි මෙන්ඩලීෆ්

04). රූපයේ දැක්වෙන්නේ එක්තරා දෘෂ්ටි දෝෂයකට පිළියම් යෙදූ අවස්ථාවකි. මෙම දෘෂ්ටි දෝෂය කුමක්ද?



1). දුර දෘෂ්ටිකත්වය
2). අවිදුර දෘෂ්ටිකත්වය
3). ග්ලුකොමාව
4). ඇසේ සුද

05). බොරතෙල්වලින් විවිධ ඉන්ධන වෙන්කර ගැනීමේ දී භාවිතා වන ක්‍රමය මින් කුමක්ද?
1). වාෂ්පීකරණය 2). හුමාල ආසවනය
3). භාගික ආසවනය 4). ස්ඵටිකීකරණය

06). පීඩනය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.
A. අභිලම්බ බලය වැඩි කරන විට පීඩනය වැඩි වේ.
B. පෘෂ්ඨ වර්ගඵලය වැඩිවන විට පීඩනය වැඩි වේ.
C. පීඩනය යනු ඒකක වර්ගඵලයක් මත ඇති වන බලයයි.
ඉහත ප්‍රකාශ වලින් සත්‍ය වනුයේ,
1). A හා B පමණි 2). A හා C පමණි
3). B හා C පමණි 4). A, B හා C පමණි

07). පුප්ඵුශීය ධමනියෙන් රුධිරය ගෙන යන්නේ කුමන අවයවය වෙතද?
1). ආමාශය 2). පෙනහැලි 3). වකුගඩු 4). අක්මාව

08). එක්තරා වෛරස් ආසාදනයක දී රුධිර පට්ටිකා සංඛ්‍යාව ශීඝ්‍රයෙන් පහල බසී. එම රෝගය වන්නේ,
1). අධික රුධිර පීඩනය 2). ක්ෂය රෝගය
3). ඩෙංගු 4). මැලේරියාව

09). බලයක් නොයෙදෙන අවස්ථාව මින් කුමක්ද?
1). ගසක ඇති ගෙඩියක් මත 2). පන්දුවට පිත්තකින් පහර දීමේදී
3). අකුරු ලිවීමේදී පෑන මත 4). අභ්‍යවකාශයේ ඇති වස්තු මත

10). අවාරයේ දී ගස්වල ඵල හට ගැන්වීමට භාවිත කරන කෘත්‍රිම වර්ධක ද්‍රව්‍යයකි.
1). නැප්තලීන් ඇසිටික් අම්ලය 2). ඉන්ඩෝල් ඇසිටික් අම්ලය
3). ඉන්ඩෝල් බියුට්‍රික් අම්ලය 4). සයිටොසෙල්

11). ශාක අග්‍රස්ථයකට එක් දිශාවකින් පමණක් ආලෝකය ලැබෙන්නට සලස්වා ඇත. මෙහිදී සිදුවන්නේ කුමක්ද?




1). A ප්‍රදේශයේ ඔක්සින වැඩිපුර එක්රැස් වේ.
2). B ප්‍රදේශයේ ඔක්සීන වැඩිපුර එක්රැස් වේ.
3). C ප්‍රදේශයේ සෛල දික්වීම වැඩිපුර සිදුවේ.
4). A හා B දෙපසම දික්වීම එකම ආකාරයකට සිදුවේ.

12). ඩොල්ෆින් සංචරණය සඳහා යොදා ගනු ලබන්නේ,
1). වරල් 2). අවල්පත් 3). පේශි 4). පාද

13). ජීවමාන පොසිලයක් නොවන්නේ,
1). ගිනිහොට මීවන ශාකය 2). සීලාකැෆ්ත් මත්ස්‍යයා
3). ලාම්පු බෙල්ලා 4). අශ්වයා

14). පෘථිවියේ මුල් ම ජීවියා ලෙස විශ්වාස කරන්නේ,
1). ඒක සෛලික නිර්වායු බැක්ටීරියාවකි.
2). ඒක සෛලික ඇල්ගාවකි.
3). මත්ස්‍යයෙකි.
4). ආත්‍රපෝඩාවෙකි.

15). යකඩ ඇණයක් මත තඹ ආලේප කිරීමට සකස් කළ ඇටවුමක් පහත දැක්වේ. X හා Y කුමක් විය යුතුද?
1). යකඩ කැබැල්ල , ෆෙරස් සල්ෆේට් ද්‍රාවණය
2). යකඩ කැබැල්ල , කොපර් සල්ෆේට් ද්‍රාවණය
3). තඹ කැබැල්ල , කොපර් සල්ෆේට් ද්‍රාවණය
4). තඹ කැබැල්ල , ෆෙරස් සල්ෆේට් ද්‍රාවණය




16). භූමිතෙල් විද්‍යුත් සන්නායකයක් නොවන්නේ,
1). එහි සචල ඉලෙක්ට්‍රෝන නොමැති නිසා.
2). එහි සචල අයන නොමැති නිසා.
3). එය වාෂ්පශීලී නිසා.
4). ඝනත්වය ජලයේ ඝනත්වයට වඩා අඩු නිසා.

17). එකිනෙකට වෙනස් ද්‍රව පරිමා තුනක ස්කන්ධ පහත ආකාරයට වේ. මෙම ද්‍රව තුනෙහි ඝනත්වය සම්බන්ධයෙන් නිවැරදිව දැක්වෙන්නේ,

1). A > B > C
2). B < A > C
3). A = B < C
4). C < A = B




18). ජීවී විශේෂයක් තුළ විවිධ වෙනස්කම් පවතී. එයට හේතුව ලෙස දක්වන්නේ,
1). සෛල තුළ පවතින ජානවල විවිධත්වය.
2). ජීවත් වන පරිසරවල විවිධත්වය.
3). ගන්නා ආහාරවල විවිධත්වය.
4). කතා කරන භාෂාවේ විවිධත්වය.

19). වියළි පතන බිම් පරිසරයට අයත් වන ප්‍රදේශයකි,
1). විල්පත්තුව 2). හල්දුම්මුල්ල 3). රක්වාන 4).වස්ගමුව

20). 'හරිත සංකල්පය' වඩාත් හොඳින් දැක්වෙන වගන්තිය,
1). පෘථිවියේ කොළ පැහැති ශාක වැස්ම වැඩි කිරීම.
2). පෘථිවියේ ස්වභාවික පරිසරයට හානි නොවන හෝ අවම හානි වන ලෙස භාණ්ඩ හා සේවා පවත්වා ගැනීම.
3). සූර්ය කෝෂ භාවිතය වැඩි කර ෆොසිල ඉන්ධන භාවිතය අඩු කිරීම.
4). රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතය.

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. A) පහත රූපයේ දක්වා ඇත්තේ රුධිර සංසරණ පද්ධතිය දක්වන දළ සටහනකි.




i). මෙහි A,B,C,D මගින් නිරූපණය කරන හෘදයේ කුටීර නම් කරන්න. (ල : 02)

ii). D වලට සම්බන්ධ රුධිර නාලය කුමක්ද? (ල : 01)

iii). X වලින් පෙන්වා ඇත්තේ කුමන රුධිර නාළ වර්ගයද? (ල : 01)

iv). පහත දේහානු වර්ග වලින් කෙරෙන කාර්යයක් බැගින් දක්වන්න.

a). රතු රුධිරාණු

b). රුධිර පට්ටිකා (ල : 02)

B) විද්‍යුත් විච්ඡේදනයේ දී විද්‍යුත් විච්ඡේද්‍ය සරල එළ බවට පත්වන බව ආදර්ශනය කිරීමට සකස් කළ ඇටවුමක් පහත දැක්වේ.




i). අල්පාම්ලික ජලය සාදාගන්නේ කෙසේද? (ල : 01)

ii). ඉහත ක්‍රියාකාරකමේ දී ලැබෙන නිරීක්ෂණයක් දක්වන්න. (ල : 01)

iii). ඉලෙක්ට්‍රෝඩ සඳහා යෙදීමට සුදුසු ද්‍රව්‍යයක් ලියන්න. (ල : 01)

iv). X හා Y වායු නම් කරන්න. (ල : 02)

C) පහත දැක්වෙන්නේ සිසුවෙක් නිර්මාණය කළ ද්‍රවමානයකි.




i). ඉහත ද්‍රවමානය පහත බඳුන්වලට දැමූ විට පිහිට ආකාරය ඇඳ දක්වන්න. (ල : 02)




ii). එක්තරා ද්‍රව්‍යයක $2m^3$ ක ස්කන්ධය 1800kg කි. මෙම ද්‍රව්‍යයේ ඝනත්වය කීයද? (ල : 02)

iii). ද්‍රවමාන භාවිතා කර ද්‍රවවල ඝනත්වය මැන බලන අවස්ථාවක් සඳහන් කරන්න. (ල : 01)

02. A) පහත රූපයේ දැක්වෙන්නේ ජීව වායු ජනකයකි.



i). ඉහත බඳුනට ඇතුල් කිරීමට වඩාත් සුදුසු ද්‍රව්‍ය 2ක් ලියන්න. (ල : 02)
ii). යම් කාලයකට පසුව පිටවන වායුව කුමක් ද? (ල : 01)
iii). ජීව වායු ජනනයට දායක වන ක්ෂුද්‍රජීවී කාණ්ඩය නම් කරන්න. (ල : 01)
iv). ජීව වායු ජනනයේ ප්‍රයෝජනයක් ලියන්න. (ල : 01)

B) පහත ප්‍රකාශ නිවැරදි නම් ✓ ලකුණද වැරදි නම් × ලකුණද වරහන තුල යොදන්න.

i). රන් සහල් නිපැදවීමේ දී බැක්ටීරියාවකගේ ජාන භාවිතා කර ඇත. ( )
ii). රෝග කාරක ක්ෂුද්‍ර ජීවීන් ධාරකයන් ලෙස හැඳින්වේ. ( )
iii). ලීෂ්මානියාව රෝග කාරකයා ශ්වසන පද්ධතිය ඔස්සේ ශරීරගත වේ. ( )
iv). ක්ෂුද්‍ර ජීවීන් ඇසුරෙන් කරන කර්මාන්ත වලදී සිදුවන පරිසර හානිය අවමය. ( )
v). දිලීර නිසා ශාකවල ශෛලම වාහිනී ආසාදනය වීම නිසා පශ්චිම අංගමාරය ඇතිවේ. ( )
vi). ස්පයිරොගයිරා සූත්‍රිකාකාර ඇල්ගී විශේෂයකි. ( )

(ල : 06)

03. A) පහත දී ඇති වචන භාවිතා කර හිස්තැන් පුරවන්න.

| |
|---|
| (දිලීර,ග්ලූකෝස්, ත්‍රි ශීර්ෂ පේශිය,ජෛව ක්ෂීරණය, උපධාන, ඔක්සිජන්, යුෂ්ටේකීය නාලය, අයනික, පීඩනය, බේසොෆිල, පිත්තල) |

i). ලෝපස් වලින් අදාල ලෝහ නිස්සාරණය..............................ලෙස හැඳින්වේ.
ii). බිම්මල් යනු .................................වල ප්‍රජනක ව්‍යූහය වේ.
iii). අල්පෙනෙති තුඩ සිහින් කර ඇත්තේ.............................................වැඩිකර ගැනීමටය.
iv). සෝඩියම් ක්ලෝරයිඩ්........................................සංයෝගයකි.
v). පෘථිවියේ මුල්ම වායුගෝලය ..................................................වලින් තොරය.
vi). .................................සංකෝචනය වන විට අත නැවෙමින් ඉහළට එසවේ.
vii). ..................................... කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන්, කුලකයට අයත් සංයෝගයකි.
viii). ..............................................කර්ණපටහපටලය දෙපස පීඩනය සමානව පවත්වා ගැනිමට උපකාරී වේ.
ix). ................................. ඝන අවස්ථාවේ ඇති සමජාතිය මිශ්‍රණයකි.
x). ……………………………………..සුදු රුධිරාණු වර්ගයකි.
xi). සන්නමන චලන දක්වන පත්‍ර පාදයේ .......................................නමැති ව්‍යූහ ඇත.

(ල : 11)

04. A) තල දර්පණයක් මත පතනය වන ආලෝක කිරණ වල හැසිරීම නිරීක්ෂණය කිරීම සඳහා කරන ලද ක්‍රියාකාරකමක් පහත දැක්වේ.




i). ලේසර පන්දමෙන් නිකුත් වී දර්පණය දක්වා ගමන් කරන කිරණය නම් කරන්න. (ල : 01)
ii). ඉහත ආලොක කිරණයේ ගමන් මාර්ගය දැක්වෙන නිවැරදි කිරණ සටහන අඳින්න. (ල : 02)
iii). X දර්පණයට අඳින ලද ලම්භ රේඛාව හඳුන්වන්නේ කෙසේ ද? (ල : 01)
iv). පහත පරාවර්තන සිදුවන පෘෂ්ඨයක් බැගින් දක්වන්න.
a) සවිධි පරාවර්තනය ........................... b) විසාරී පරාවර්තනය .......................

(ල : 02)

B) i). පහත සංයෝගයේ අඩංගු මූල ද්‍රව්‍ය දක්වන්න (ල : 03)
$CuSO_4$

ii). Na පරමාණුවක ඇති ඉලෙක්ට්‍රෝන ගණන 11කි. නියුට්‍රෝන ගණන 12කි. එම Na පරමාණුව සම්මත ආකාරයට ලියා දක්වන්න. (ල : 02)

05. A) 9 ශ්‍රේණියේ සිසුහු විවිධ පරිසර පද්ධති වල ක්ෂේත්‍ර චාරිකා වල නිරත වී ලබාගත් නිරීක්ෂණ ඇසුරින් පහත වාර්තාව සකස් කර ඇත.

i). එම තොරතුරු වලට ගැලපෙන පරිසරය වගුව තුල සඳහන් කරන්න.

| වාර්තා කළ නිරීක්ෂණය | පරිසරය |
|---|---|
| a. ශාක මුදුන් පැහැදිලි ලෙස ස්ථර තුනකට වෙන් වී ඇත. ශාක මත අපිශාක හා ආරෝහක ශාක බහුලය. | ................................ |
| b. ශාක මදක් කුරු ස්වභාවයක් ගනී. ගැට සහිතය. කඳන් ඇඹරී ඇත. කඳන් මත අපිශාක බහුලය. | ................................ |
| c. පොළොව මතුපිට සිහින් තෘණ ශාක වැස්මකි. මානා නැමති තෘණ වර්ගය බහුලය. | ................................ |
| d. මාංසල පත්‍ර සහිත ශාක කටු සහිතය. පත්‍ර සංඛ්‍යාව අඩුය. කිරි සහිත ශාක බහුලය. උෂ්ණත්වය 34 °C ට වඩා වැඩිය. | ................................ |

(ල : 04)

ii). ස්වභාවික වනාන්තරය සහ කෘෂිකාර්මික පරිසරය අතර වෙනස්කමක් සඳහන් කරන්න. (ල : 02)

iii). ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් පරිසරයක ව්‍යාප්ත වීම. ජෛව විවිධත්වය කෙරෙහි තර්ජන ඇති කරයි. එවැනි ජීවීන් දෙදෙනෙක් නම් කරන්න. (ල : 02)

iv). ජෛව විවිධත්ව හායනයට බලපා ඇති ස්වභාවික තර්ජන දෙකක් ලියන්න. (ල : 02)

v). 'ජෛව විවිධත්ව උණුසුම් කලාපයක්' ලෙස හඳුන්වන්නේ කුමන ප්‍රදේශද? (ල : 01)

06. A) මල් පෝච්චියක සිටුවන ලද පැලයක් රූපයේ ආකාරයට නැවී වැඩෙයි. මේ සඳහා යම් වර්ධක ද්‍රව්‍යයක් හේතු වී ඇත.




i). X ස්ථානයේ රැස් වුණ වර්ධක ද්‍රව්‍යය කුමක්ද? (ල : 01)

ii). ඉහත ශාකයේ හැසිරීමට හේතු වුණ උත්තේජය විය හැක්කේ කුමක්ද? (ල : 01)

iii). පහත දැක්වෙන ශාක චලන සඳහා උදාහරණය බැගින් ලියන්න.

a). සන්නමන චලන

b). ආවර්තී චලන (ල : 02)

iv). පහත වම්පස X කොටසේ සඳහන් ප්‍රකාශ වලට ගැලපෙන වචනය Y කොටසින් තෝරා ඊට අදාළ අක්ෂරය වරහන් තුල යොදන්න.

| X කොටස | | Y කොටස |
|---|---|---|
| a. ශාක කඳන් වල දික් වීම කෙරෙහි බලපාන වර්ධක ද්‍රව්‍යයකි. | ( ) | A. ඔක්සීන |
| b. සෛල විභාජනය වේගවත් කරයි. | ( ) | B. සයිටොසෙල් |
| c. කඳෙහි හා මුලෙහි සෛල දික්වීම පාලනය කරයි. | ( ) | C. ගිබරලින් |
| d. කෘත්‍රිම වර්ධක ද්‍රව්‍යයකි. | ( ) | D. සයිටොකයිනීන් |

(ල : 04)

B) පරිණාමය සිදු වූ බවට ඇති සාක්ෂි අතරින් පොසිල ඉතා වැදගත් සාක්ෂි සපයයි.

i). ජීවමාන පොසිල යනු මොනවාද? (ල : 01)

ii). ජීවමාන පොසිල සඳහා උදාහරණයක් ලියන්න. (ල : 01)

iii). කොස්මොසොයික් වාදය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල : 01)

07. A) දිග,පළල,උස පිළිවෙලින් 2m, 1m, 1m වන ලී කුට්ටියක් පහත දැක්වේ. (ල : 02)




i). ලී කුට්ටියේ බර 200N වේ නම්, X පතුල මත ඇති වන පීඩනය ගණනය කරන්න. (ල : 02)

ii). ලී කුට්ටියේ Y පෘෂ්ඨය බිම ස්පර්ශ වන ලෙස තැබූ විට ඇති වන පීඩනය ගණනය කරන්න. (ල : 02)

iii). පීඩනය කෙරෙහි බලපාන සාධක සොයා බැලීමට පහත ක්‍රියාකාරකම සිදුකරයි.




a). ඉහත ක්‍රියාකාරකමේ දී ලැබුණ නිරීක්ෂණය කුමක්ද? (ල : 02)

b). ඉහත සොයා බැලූ සාධකය කුමක්ද? (ල : 02)

B) බලයක විශාලත්වය, දිශාව, උපයෝගී ලක්ෂ්‍යය සරල රේඛා ඛණ්ඩයක් මගින් රූපිකව නිරූපණය කළ හැකිය.

i). මේසයක් මත තැබූ ලී කුට්ටියක් මත 10N ක බලයක් නැගෙනහිර දිශාවට ක්‍රියා කරන ආකාරය බල රේඛීවකින් නිරූපණය කරන්න.1 cm = 2N ලෙස සලකන්න.) බලය ක්‍රියාකරන ලක්ෂ්‍යය X ලෙස ලකුණු කරන්න. (ල : 03)

ii). බල ක්‍රියා කල ද වස්තුව නිශ්චලවම පවතින අවස්ථාවක් සඳහන් කරන්න. (ල : 01)

# 2023 – 9 ශ්‍රේණිය (දෙවන වාරය)

## විද්‍යාව පිළිතුරු පත්‍රය I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1) | 3 | 6) | 2 | 11) | 2 | 16) | 1 |
| 2) | 4 | 7) | 2 | 12) | 2 | 17) | 3 |
| 3) | 3 | 8) | 3 | 13) | 4 | 18) | 1 |
| 4) | 1 | 9) | 4 | 14) | 1 | 19) | 3 |
| 5) | 3 | 10) | 4 | 15) | 3 | 20) | 2 |

## විද්‍යාව පිළිතුරු පත්‍රය II

01. A). i A - දකුණු කර්ණිකාව B - වම් කර්ණිකාව
C - දකුණු කෝෂිකාව D - වම් කෝෂිකාව (ල .2)
ii සංස්ථානික මහා ධමනිය (ල .1)
iii රුධිර කේශනාලිකා (ල .1)
iv a) - $O_2$ පරිවහණය (ල .2)
b) - රුධිරය කැටි ගැස්සවීම

B). i ආස්‍රැත ජලයට තනුක $H_2SO_4$ අම්ලය බිංදු කිහිපයක් එක් කිරීම (ල .1)
ii ඉලෙක්ට්‍රෝඩ අසලින් වායු බුබුළු පිටවීම (ල .1)
iii කාබන් කූරු (ල .1)
iv $X – O_2$ $Y- H_2$ (ල .1)

C). i



ජලය භූමිතෙල් රසදිය (ල .2)

ii ඝනත්වය $= \frac{\text{ස්කන්ධය}}{\text{පරිමාව}} = \frac{1800\ kg}{2\ m^3} = 900\ kg^{-3}$ (ල .2)
iii ගැලපෙන පිළිතුරකට (ල .1)

02. A). i). සුදුසු ද්‍රව්‍ය (ල .2)
ii). මීතේන් (ල .1)
iii). නිර්වායු බැක්ටීරියා (ල .1)
iv). ගැලපෙන පිළිතුරකට (ල .1)

B) i. ✓ iv. ✓
ii. × v. ✓
iii. × vi. ✓

03. A) i. ජෛවක්ෂීරණය iv. අයනික vii. ග්ලූකෝස් x. බේසෝෆිල
ii. දිලීර v. ඔක්සිජන් viii. යුෂ්ටේකීය නාලය xi. උපධාන
iii. පීඩනය vi. ත්‍රි ශීර්ෂ පේශිය ix. පිත්තල (ල .11)

04. A) i. පතන කිරණය (ල .1)
ii. නිවැරදි රූපය (ල .2)

iii. අභිලම්බය (ල .1)
iv. a) තල දර්පණය
b) රළු පෘෂ්ඨ (ල .2)

B) i. කොපර්, සල්ෆර්, ඔක්සිජන් (ල .2)
ii. a) 11
b) $^{23}_{11}Na$ (ල .2)

05. i. a) - තෙත් වර්ෂා වනාන්තර c) - වියළි පතන
ii. b) - කඳුකර වන්න්තර d) - කටු පඳුරු හා ලඳු කැලෑ (ල .4)

06. A) i. ඔක්සීන (ල .1)
ii. ආලෝකය (ල .1)
iii. a) හා b) සුදුසු චලන ආකාර සඳහා
iv. a) C b) D c) A d) B (ල .4)

07. A) i. x වර්ගඵලය = $1m \times 2m = 2m^2$

පීඩනය = $\frac{200N}{2M}$ = $100Nm^{-2}$ (100Pa) (ල .2)

ii. පීඩනය = $\frac{200N}{1m^2}$ = $200Nm^{-2}$ (100Pa) (ල .2)

iii. එක මත තබන ගිනිපෙට්ටි ගණන වැඩි විට ගිලෙන ප්‍රමාණය වැඩිය (ල .2)
iv. අභිලම්බ බලය (ල .1)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න